# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,159- 2020 ජනවාරි මස 17 වැනි සිකුරාදා - 2020.01.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු ඇබෑර්තු

#### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන්ගේ අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය විය යුතුය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතුය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතුය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2020 පෙබරවාරි මස 17 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 දෙසැම්බර් මස 24 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කළුතර | පානදුර | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ එළුවිල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |

01-467

---

#### ශ්‍රී ලංකා පොලීසිය

උප පොලිස් පරීක්ෂක තනතුර (සාමාන්‍ය)

ශ්‍රී ලංකා පොලිසියේ ආධුනික උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ/ බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගැනීමේ කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2020.02.17 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,93,480 - 7 x 4,440 - 2 x 5,940 - 25 x 7,920 - රු. 6,34,440.00

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. 03/2016 අනුව සිදුකර ඇත.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (*අ*) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 .00 |
| (*ආ*) | රා. ප. ච. 03/2016 ට අනුව මූලික වැටුපට හිමිවිය යුතු 40% දීමනා | රු. 13,116 .00 |
| (*ඇ*) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 .00 |
| (*ඈ*) | දුෂ්කර දීමනාව | රු. 2,000 .00 |
| (*ඉ*) | අන්තර් දීමනාව | රු. 2,500 .00 |
| (*ඊ*) | සංයුක්ත දීමනා රු. 12,000.00 (විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා උපරිමය) රු. 11,200.00 (විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා උපරිමය) | |

*මෙම දීමනාවලට අමතරව* -

(*අ*) නොමිලේ ගමන් පහසුකම්,

(*ආ*) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටකදී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(*ඇ*) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(*ඈ*) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(*ඉ*) රාජකාරි සඳහා ගමන් වියදම් ද, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(*අ*) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතුය. එසේ වුවද දැනට ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරින්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 06කින් සමත්ව එයින් විෂයයන් 04ක් සඳහා සම්මාන සාමාර්ථ තිබිය යුතු අතර, ඉන් 02ක් මාධ්‍ය භාෂාව හා ගණිතය විය යුතු අතර,
- අයදුම්කරු අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 03ක් සමත්විය යුතුය.

***සටහන 01*** .- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙස ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

***සටහන 02*** .- අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

***සටහන 03***.-වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(*ඇ*) *ශාරීරික සුදුසුකම්* :

- උස අඩි 05 යි අඟල් 06 යි. (අවම),
- පපුව අඟල් 32 (අවම/හුස්ම නාල්ලා).

***සටහන*** .- විශිෂ්ට ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(*ඈ*) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්.*— එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කරුවකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(*ඉ*) *අනෙක් සුදුසුකම්* :

* අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන පොලිස් නිලධාරින්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

- අයදුම්පත්‍රය අනුව මූලික සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

මීටර් 1,000 දිවීම මිනිත්තු 03 තත්පර 14

- යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය ප්‍රශ්නපත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

- වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.—කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
- සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.—කාලය පැය 01 යි.

---


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 පෙබරවාරි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජනවාරි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

06. *වෛද්‍ය පරීක්ෂණය* :

අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්‍ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්‍ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණය පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා විසින් වෛද්‍ය පරීක්‍ෂණයේ වාර්තා සෞඛ්‍ය 169 පෝරමය යටතේ ඉදිරිපත් කරන අතර වෛද්‍ය පරීක්‍ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

07. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරින් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරින්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :

- මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝග යන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙක්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්‍ෂණවලින් සමත් විය යුතු ය. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරින් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතුන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික උප පොලිස් පරීක්‍ෂකවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික උප පොලිස් පරීක්‍ෂකවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික උප පොලිස් පරීක්‍ෂකවරුන් සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතු ය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරයකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන*.— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

සී. ඩී. වික්‍රමරත්න,
*වැඩ බලන* පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

(අඟල් 2)

(අඟල් 1 1/2) **කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

**ශ්‍රී ලංකා පොලිසිය**

**ආධුනික උප පොලිස් පරීක්‍ෂක තනතුර**

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම :———.
(පැහැදිලි ලොකු අකුරෙන්) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පතේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.
(ආ) නම (මුලකුරු සමග) :———.
(ඇ) අයදුම් කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කරු උපන් ස්ථානය :———.
උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :———.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
(ඊ) ලිපි හුවමාරු කළ යුතු ලිපිනය :———.
(උ) දුරකථන අංකය : නිවස :———. ජංගම :———.

06. (අ) ජාතිය :———.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.
(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.
* අයදුම්කරු :———.
* අයදුම්කරුගේ පියා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :———. මාස :———. දින :———.

08. උස : අඩි :———. අඟල් :———.
පපුව : අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :———.

10. අතිරේක සුදුසුකම් :———. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :———.

12. (අ) දැනට කරන රැකියාව :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :———.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :———.

14. ඔබ ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ———.
(ආ) ———.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිසියේ සේවය කර තිබේ ද ? :———.
තනතුර හා නිල අංකය :———.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන ලද සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන ලද සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලිසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා/ මිය/මෙනවිය .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව

තනතුර :———.
දිනය :———.

01-552/1

---

**ශ්‍රී ලංකා පොලිසිය**

කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුර (සාමාන්‍ය)

ශ්‍රී ලංකා පොලිසියේ ආධුනික කාන්තා උප පොලිස් පරීක්‍ෂක තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහලින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2020.02.17 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,93,480 - 7 x 4,440 - 2 x 5,940 - 25 x 7,920 - රු. 6,34,440.00

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. 03/2016 අනුව සිදුකර ඇත.

තවද මෙම නිලධාරිනියන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (ආ) | රා. ප. ච. 03/2016ට අනුව මූලික වැටුපට හිමිවිය යුතු 40% දීමනා | රු. 13,116 0 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 0 |
| (ඈ) | දුෂ්කර දීමනාව | රු. 2,000 0 |
| (ඉ) | අන්තර් දීමනාව | රු. 2,500 0 |
| (ඊ) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා උපරිමය) | රු. 12,000. 0 |
| | (විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා උපරිමය) | රු. 11,200. 0 |

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරිනියන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය. එසේ වුවද දැනට ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරියන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 06කින් සමත්ව එම විෂයයන් 04ක් සඳහා සම්මාන සාමාර්ථ තිබිය යුතු අතර, ඉන් 02ක් මාධ්‍ය භාෂාව හා ගණිතය විය යුතු ය. තවද,
- අයදුම්කාරිය අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 03ක් සමත්විය යුතුය.

***සටහන 01*** : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

***සටහන 02*** : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

***සටහන 03*** : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඈ) *ශාරීරික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 04 යි. (අවම),

***සටහන*** : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කාරියකගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඉ) *දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන්.*— එක් ඇසක දෘෂ්ඨිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කාරියක් උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) *අනෙක් සුදුසුකම්* :

* අයදුම්කාරිය අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන පොලිස් නිලධාරියන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

- අයදුම්පත්‍රය අනුව සුදුසුකම් ලබන අයදුම්කාරියන් ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

  මීටර් 1,000      මිනිත්තු 05 තත්පර 14

- යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

- ලිඛිත පරීක්ෂණය ප්‍රශ්නපත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,
  - වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.—කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
  - සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.—කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :

අයදුම්කාරියන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණයට බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කාරියන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කාරියන්ගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඇය හා ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඇය ඇසුරු කරන්නන්ගේ යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන්/නිලධාරිනියන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන්/නිලධාරිනියන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්/නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් නතර කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :

- මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු පරිවාස කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරිනියකම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතු ය. නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරිනීන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කාරිය පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක පරිවාස සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතු වන අතර මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔවුන්ගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන් ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතු ය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කාරිය තෝරා ගන්නා ලද්දේ නම් ඇය නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.

(ආ) අයදුම්කාරිය විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරයකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

සී. ඩී. වික්‍රමරත්න,
වැඩ බලන පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

(අඟල් 2)

(අඟල් 1 1/2) **කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

**ශ්‍රී ලංකා පොලීසිය**

**ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුර (සාමාන්‍ය)**

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම :———.
(පැහැදිලි ලොකු අකුරෙන්) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පතේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.
(ආ) නම (මුලකුරු සමඟ) :———.
(ඇ) අයදුම් කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කරු උපන් ස්ථානය :———.
උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :———.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
(ඊ) ලිපිහුවමාරු කළයුතු ලිපිනය :———.
(උ) දුරකථන අංකය : නිවස :———. ජංගම :———.

06. (අ) ජාතිය :———.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.
(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.
* අයදුම්කරු :———.
* අයදුම්කරුගේ පියා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :———, මාස :———, දින :———.

08. උස : අඩි :———. අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :———.

10. අතිරේක සුදුසුකම් :———. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :———.

12. (අ) දැනට කරන රැකියාව :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :———.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :———.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි (ඥාතීන් නොවන) දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ———.
(ආ) ———.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවය කර තිබේ ද ? :———.
තනතුර සහ නිල අංකය :———.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන ලද සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———.
අයදුම්කාරියගේ අත්සන.

දිනය :———.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................ මයා/ මිය/මෙනවිය .................. දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

තනතුර :———.
දිනය :———.

01-552/2

---

# විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

(ISO 9001:2015 නවතම තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි)

නිපුණතා සංවර්ධන, රැකී රක්ෂා හා කම්කරු සම්බඳතා අමාත්‍යාංශය

Sri Lanka Institute of Printing opens the door to a rewarding Carrier in Printing, Graphics, Multi Media & Packaging Industry

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2020**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

*පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ - 4 පාඨමාලාව*

***NVQ - 4 Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)***

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

*පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන)    මාධ්‍යය : සිංහල    පාඨමාලා ගාස්තුව : රු. 23,000.*

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර, පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

*කාලය : මාස 04 (අර්ධ කාලීන)　　මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 13,500.*

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

*කාලය : මාස 05 (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි*

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 18,000/- NVQ - 4 සහතික පත් පාඨමාලාව රු. 23,000.

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර, මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර, ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

*කාලය : මාස 05 (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි*　　පාඨමාලා ගාස්තුව : රු. 14,000.

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

*කාලය : මාස 04 (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 17,000.*

**ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

*පාඨමාලා කාලය : අවුරුදු 01 (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 20,500.*

**නවතම 2018 වර්ෂයේ නිෂ්පාදිත වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව - Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගීවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidlberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස් ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායී පුහුණුවකි.

*පාඨමාලා කාලය : වසර 03 යි (අර්ධ කාලීන)　　මාධ්‍යය : සිංහල　　පාඨමාලා ගාස්තුව : රු. 25,500*

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබාදී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

*කාලය : මාස 04 යි (අර්ධ කාලීන)　　මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 20.500*

**ආංකික පෙර මුද්‍රණය - Digital Prepress**

මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි නියැළි සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වේ. මේ තුළින් නවීන පෙර මුද්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් ලබා ගත හැක.

*පාඨමාලා කාලය : අවුරුදු 01 (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 23,000.*

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Deisign for Print**

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටලු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබා දේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

*කාලය : අවුරුදු 01 (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 16,500.*

**මුද්‍රණ නිෂ්පාදන කළමණාකරණය - Print Production Management**

මුද්‍රණ ක්ෂේත්‍රයේ මෙන්ම ඒ හා ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි නියුතු පුද්ගලයන්ට මුද්‍රණ නිෂ්පාදන කළමණාකරණය පිළිබඳ මුද්‍රණ තාක්‍ෂණික හා කළමණාකාරිත්වයට අදාළ වැදගත්ම කරුණු අලලා මෙම පාඨමාලාව සකස් කොට ඇත. මෙම පාඨමාලාව මුද්‍රණ ක්ෂේත්‍ර සැපයුම් ක්ෂේත්‍ර ඇසුරුම් ක්ෂේත්‍ර, මුද්‍රණ අලෙවිකරණ වැනි මුද්‍රණ ක්ෂේත්‍රයට සෘජු හෝ වක්‍රව සම්බන්ධ සියලු පාර්ශ්වයන්ට මහත් ප්‍රයෝජනවත් වේ.

*කාලය : මාස 06 (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 20,000.*

**වෙබ් අඩවි නිර්මාණකරණය සහ ප්‍රවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Web Design and Development**

වසරක් පුරා පැවැත්වෙන මෙම ඩිප්ලෝමාව මගින් සිසුන්ට Web Design සහ Web Development පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ ප්‍රායෝගික දැනුමක් ලබා දේ.
*කාලය : වසර 01 යි (අර්ධ කාලීන)　　මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 40,000.*

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුළින් ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල්වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත.
මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැලි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ට ද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

*කාලය : වසර 01 යි (අර්ධකාලීන)　　මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 40,000.*

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්‍ෂෙත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකතන අංක : 011 2686162 , 011 2679791. 0777706995
ෆැක්ස් : 011 2686162 ඊ-මේල් : sliopreg@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

*ශාඛා* :- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.
දුරකතන අංක : 066 2222172
071 0554298

01-527

**කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 (I) 2020**

1.0 කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා අදළ අනුමත සේවා ව්‍යවස්ථාවන්හි විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2020 මැයි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාගයට අදාළ වන අයදුම්කරුවන් පිළිබඳව අංක 1840/34 සහ 2013.12.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදය, 15 අන්තර්කාලීන විධිවිධාන සහ ඇමුණුම 04 හි තොරතුරු දක්වා ඇත.

3.0 මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති සේවා ව්‍යවස්ථාවේ, III ශ්‍රේණියේ නිලධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකරන ලද එහෙත් එම විභාගයෙහි (1) කාර්යාල ක්‍රම (2) ගිණුම් ක්‍රම හා (3) පරිගණක පරීක්ෂණය යන විෂයයන් එකක් හෝ කිහිපයක් සමත් වූ හෝ නිදහස් කරන ලද නිලධාරින් මෙම සේවා ව්‍යවස්ථාවෙහි III ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙහි අදාළ විෂයයන්ගෙන් විෂයයෙන් විෂයයට පදනම මත නිදහස් කරනු ලැබේ. පත්වීමේ දින සිට වසර තුනක් ඇතුළත මෙම විභාගය සමත් විය යුතුය.

4.0 කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල, රත්නපුරය හා කිලිනොච්චිය යන නගරවලදී පැවැත්වේ. අදාළ නගර හා නගර අංක පහත වගුවේ දක්වේ. ඉල්ලුම් කල නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 05 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| බදුල්ල | 21 |
| රත්නපුරය | 24 |
| කිලිනොච්චිය | 25 |

ඉහත කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයදුම්කරුවන් යොමු කෙරෙනු ඇත.

5.0 (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට අයදුම්කරුවන් යටත් වේ.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

6.0 අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අයදුම්කරුවන් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2020 පෙබරවාරි මස 17 දින හෝ ඊට පෙර ලැබෙන සේ,

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503,
කොළඹ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අද ාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

***සටහන***.-මෙම *ගැසට්* නිවේදනයට සමගාමීව පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා මගින් ද අනෙකුත් අදාළ ආයතනවල අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන එම ආයතන මගින් ද නිකුත් කරනු ඇත.

ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් සහ මෙම විභාගයට අයදුම්කරන අනෙකුත් ආයතනවල නිලධාරින්ගේ අයදුම්පත්‍ර වෙන්කර ගැනීමේ පහසුව සඳහා අයදුම්පත්‍රයේ ශීර්ෂයේ අදාළ සේවාව හෝ ආයතනය දැක්වීමේදී සංකේත අංකයක් ඇතුළත් කළ යුතුවේ. ඒ අනුව **ඒකාබද්ධ සේවයට අයත් නිලධාරින්ගේ සංකේත අංකය 10 වේ.** එම අංකය අයදුම්පතේ දකුණු පස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතුය.

7.0 *විභාග අපේක්ෂකයන්ගේ අනන්‍යතාව* - විභාග අපේක්ෂක/අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

8.0 *අයදුම්පත්‍ර* - අංක 1.0 සිට 3.0 දක්වා ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලටද ඇතුළත් වන පරිදි ''ඒ 4'' ප්‍රමාණයේ කඩදසියක අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල/දෙමළ අයදුම්පත්‍රවල සිංහලට/දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද/දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කරන්න. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රයට විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලුම තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කර ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* - ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරින් විසින් ඉල්ලුම්කරන එක් විෂයයක් සඳහා රු. 250 ක් ද විෂයයන් දෙකක් හෝ සම්පූර්ණ විභාගය සඳහා ඉල්ලුම්කරන්නේ නම් රු. 500 ක් ද වශයෙන් විභාග ගාස්තුව ගෙවිය යුතුය. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අය කිරීමක් සිදු නොකරන බව කාරුණිකව දන්වමි. මොනම කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

9.0 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තම ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තරය සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම්, ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

10.0 අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් විභාගයට පෙනී සිටින පළමු දිනයේදීම විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.1 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

11.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර අදළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 තමන් කැමති වන්නේ නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂයය සඳහා වූ මුළු ලකුණුවලින් <u>අවම වශයෙන් සියයට හතලිහක් (40%ක්)</u> නිලධාරින් විසින් ලබාගත යුතුවේ.

13.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන අතර අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ඇත.

14.0 විභාග පරිපාටිය : අයදුම්කරුවන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| | *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|---|
| 1. | කාර්යාල ක්‍රම | 01 | 100 යි | පැය 02යි |
| 2. | ගිණුම් ක්‍රම | 02 | 100 යි | පැය 02 යි |
| 3. | පරිගණක පරීක්ෂණය | 03 | 100 යි | පැය 01 1/2 යි |

14.1 කාර්යාල ක්‍රම (විෂය අංකය - 01)
රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරි ලිපිලේඛන මැනවින් අවබෝධ කොටගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස්/නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාවද පරීක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය <u>කොටස් දෙකකින් යුක්ත වේ.</u>

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25 යි.)

II වන කොටස - ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් තුනකට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75 යි)

14.2 ගිණුම් ක්‍රම (විෂය අංකය -02)

රජයේ කාර්යාලවල භාවිත වන මූලික ගිණුම් හා ගිණුම් ක්‍රම ද මුදල් පාලන පොත්වල කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම් මැනීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය <u>කොටස් දෙකකින් යුක්ත වේ.</u>

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25යි)

II වන කොටස - ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් තුනකට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75 යි)

14.3 පරිගණක පරීක්ෂණය (විෂය අංකය - 03)

අයදුම්කරුට පහත සඳහන් හැකියාවන් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ.

(i) තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප
(ii) වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය
(iii) ගොනු කළමනාකරණය
(iv) වදන් සැකසුම
මූලික කුසලතා, තිරයට හුරුවීම, පාඨ සංස්කරණය
පාඨ එකේලි කිරීම, අකුරු වර්ග හා උපලක්ෂණ, අනුච්ඡේද, ඡේද, පේළි අතර පරතරය වෙනස් කිරීම
පිමි අනුයෝගය (Tab Setting), පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය,
අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද
තීරු යෙදීම, පිටු සැකසීම
ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය, අනුපිළිවෙළට සැකසීම
ගොනු කළමනාකරණය
ලේඛනයක් ලිපිනයන් කිහිපයකට යැවීමට සැකසීම
මැක්‍රෝ භාවිතය
(v) පැතුරුම්පත්
මූලික කුසලතා
ආකෘතිකරණය (Formatting)
සංස්කරණය
තීරු හා පරාස, නව ඇතුළත් කිරීම් හා ඉවත් කිරීම්
දත්ත අනුපිළිවෙළට සැකසීම
ප්‍රස්තාර සැකසීම
මුද්‍රණය
@ශ්‍රිතය (@ Function)
මැක්‍රෝ භාවිතය
ගොනු කළමනාකරණ
(iv) අන්තර්ජාලය හා විද්‍යුත් තැපෑල
අන්තර්ජාලය හැඳින්වීම, මූලික කුසලතා, විද්‍යුත් තැපෑල ලබා ගැනීම
විද්‍යුත් තැපෑල යැවීම, ඊට ප්‍රතිචාර දැක්වීම
ඇමුණුම භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය
පණිවුඩ සම්පාදනය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වන කොටස - බහුවරණ/කෙටි පිළිතුරු ප්‍රශ්න 40කින් යුක්ත වේ. කාලය මිනිත්තු 45යි. (ලකුණු 40යි)
II වන කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 05 කි. කාලය මිනිත්තු 45 යි. (ලකුණු 60).

15.0 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

17.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2020 ජනවාරි මස 02 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

**ආදර්ශ අයදුම්පත**

**කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(I) 2020**

**Efficiency Bar Examination for Officers in Grade III of Management Service Officer's Service - 2013 (I) 2020**

| | නගරය | නගර අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |

(*ගැසට්* නිවේදනයේ 4.0 ඡේදයට අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර කැමැත්තේ අනුපිළිවෙලට සඳහන් කරන්න. මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

ඔබ අයත්වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර *ගැසට්* නිවේදනයේ 6.0 ඡේදයේ සටහන බලන්න.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදළ අංකය කොටුව තුළ ලියන්න)
මෙය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA )
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා : GUNAWARDHANA, H. M. S. K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදළ අංකය කොටුව තුළ ලියන්න)
3.2 උපන් දිනය : වර්ෂය □□□□ මාසය □□ දිනය □□
3.3 ජාතික හැඳුනුම්පත් අංකය : □□□□□□□□□□□□

4.0 ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/විෂයයන් (*ගැසට්* නිවේදනයේ 14.0 වන ඡේදය බලන්න.)

| අනු අංකය | විෂයය | විෂය අංකය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

5.0 දැනට දරන තනතුර
5.1 තනතුර :————.
5.2 පත්වීම් ලිපියේ අංකය :————.

6.0 6.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද? :————.
6.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
6.3 තැපැල්/උපතැපැල් කාර්යාලය :————.
6.4 ලදුපත් අංකය :————.
6.5 දිනය :————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 500/- ක් ද, එක් විෂයක් සඳහා රු. 250/- ක් ද වන අතර එම මුදල ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රු. . . . . . . . . . . තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සටහන : තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .................................. මහතා/මහත්මිය/මෙනවිය .............. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
(ii) නිලධාරියා/නිලධාරිනිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/නොසිටි* බවත්,
(iii) නිලධාරියා/නිලධාරිනිය* මෙයට පෙර විභාගයට පෙනී සිට ඇති නිසා නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,
(iv) නිලධාරියා/නිලධාරිනිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

මම සහතික කරමි.

* අදාළ නොවන වචන කපා හරින්න.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
සහ නිල මුද්‍රාව

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

01-504

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## බඩු බාහිරාදිය විකිණීම්

**ශ්‍රී ලංකා පොලිසිය - කැළණිය කොට්ඨාසය**

පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසිය

ශ්‍රී ලංකා පොලිසියේ කැළණිය පොලිස් කොට්ඨාසයට අයත් පොලිස් ස්ථානවල සහ කාර්යාලවල පාවිච්චි කර ගර්හිත කරන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2020.01.28 දින පැය 10.00 ට පැලියගොඩ පොලිස් ස්ථාන පරිශ්‍රයේ දී පැවැත්වේ.

2020.01.27 වැනි දින පැය 13.00 සිට පැය 16.00 දක්වා අදළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

වෙන්දේසි භූමියට ඇතුලුවන සියලුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා ලදුපත් ලබා ගත යුතු යි. වෙනත් ගෙවුම් ක්‍රම භාවිතා නොකෙරේ. (චෙක්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්)

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ 2020.01.28 වැනි දින පැය 16.00 ට පෙර අදළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතුයි. එසේ ඉවත් කර නොගන්නා භාණ්ඩ පිළිබඳව වග කියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම සහ විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩල විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

ඩබ්. කේ. ජේ. රොෂාන් ඩයස්,
පොලිස් අධිකාරි,
කැළණිය කොට්ඨාසය.

**උපලේඛනය**

කැළණිය කොට්ඨාසයේ වෙන්දේසි කිරීම සඳහා ඇති භාණ්ඩ ලැයිස්තුව

| | | |
|---|---|---|
| 1. | අයන් (ස්ත්‍රික්ක) | 02 |
| 2. | පැක්ස් යන්ත්‍ර | 05 |
| 3. | බාල්දි 05 | |
| 4. | මන්නා පිහි | 09 |
| 5. | මේස විදුලි පංකා | 06 |
| 6. | විදුලි කේතල | 01 |
| 7. | රේඩියෝ කැසට් යන්ත්‍ර | 06 |
| 8. | මල්ටි පොට් | 03 |
| 9. | වතුර පිල්ටර් | 02 |
| 10. | වතුර මෝටර් | 01 |
| 11. | විදුලි පන්දම් රතු | 01 |
| 12. | පාපැදි | 05 |
| 13. | ඇලුමිනියම් ජෝගු | 04 |
| 14. | වානේ සේප්පු | 01 |
| 15. | වාහන පරීක්ෂා කිරීමේ කණ්නාඩි | 02 |
| 16. | ආරක්ෂක වැට | 02 |
| 17. | පීඩන ලාම්පු | 01 |
| 18. | ලන්තෑරුම් | 02 |
| 19. | ගෑස් ලාම්පු | 01 |
| 20. | මේස ලිපිකරු අයන් | 01 |
| 21. | යතුරු ලියන සිංහල | 11 |
| 22. | යකඩ කූරු | 02 |
| 23. | සිවිලින් පෑන් | 20 |
| 24. | කාර්යාල ලොකු රෝද පුටු | 01 |
| 25. | සී. එල්. අයි. යුනිට් | 03 |
| 26. | රූපවාහිනී | 08 |
| 27. | ටයිප් රයිටර් ටූල්කිට් | 01 |
| 28. | යකඩ කැබිනට් | 01 |
| 29. | යකඩ කබඩ් | 17 |
| 30. | ග්ලයින්ඩර් | 01 |
| 31. | වෝටර් බොයිලේරු | 06 |
| 32. | හීටර් | 01 |
| 33. | පින්ටර් | 02 |
| 34. | අත් හිරමන | 02 |
| 35. | යකඩ කියත් | 01 |
| 36. | මල් ඉස්කුරුප්පු නියන් | 01 |
| 37. | උල් අඩු | 01 |
| 38. | පෙරව තල | 04 |
| 39. | විල් බැරෝ | 02 |
| 40. | කොන්ඩි පට්ටම් | 01 |
| 41. | ගිණි නිවීමේ උපකරණ | 05 |
| 42. | ස්පීකර් සෙට් | 01 |
| 43. | යතුරු ලියන ඉංග්‍රීසි | 02 |
| 44. | ගෑස් කුකර් | 03 |
| 45. | රයිස් කුකර් | 02 |
| 46. | සාස්පාන් 18" | 02 |
| 47. | සාස්පාන් 16" | 03 |
| 48. | සාස්පාන් 12" | 02 |
| 49. | ගෑස් සිලින්ඩර් ලොකු | 01 |
| 50. | ඇලුමිනියම් කේතල | 01 |
| 51. | ලයිට් සිකුරුටි | 01 |
| 52. | රයිස් බොයිලේරු | 02 |
| 53. | තණකොළ කපන මැෂින් | 01 |
| 54. | යූ. පී. එස්. | 04 |
| 55. | පරිගණක යන්ත්‍ර | 01 |
| 56. | රේක්ක | 01 |
| 57. | ප්ලේන් ජෝගු | 03 |
| 58. | පිඟන් එනමල් | 01 |
| 59. | විදුලි පන්කම් එවරෙඩි | 03 |
| 60. | විදුලි පන්දම් ටයිගර් හෙඩ් | 04 |
| 61. | පාපැදි පැඩල් ජෝඩු | 04 |
| 62. | පාපැදි ස්පෝක් | 311 |
| 63. | පාපැදි ඇක්ෂල් කෝන් | 25 |
| 64. | පාපැදිචේන් | 02 |
| 65. | පාපැදි හබ් පිටුපස | 05 |
| 66. | පාපැදි ලගේජ් | 01 |
| 67. | පාපැදි කටර්පින් | 06 |
| 68. | ඉබි යතුරු 2 1/2 | 02 |
| 69. | ශීතකරණ | 01 |
| 70. | වානේ අල්මාරි | 02 |
| 71. | පයිල් කබඩ් | 02 |
| 72. | වානේ රාක්ක | 01 |
| 73. | පරිගණක පුටු | 03 |
| 74. | පුටු යකඩ | 02 |
| 75. | අමුත්තන් සඳහා පුටු | 02 |
| 76. | ගාඩන් ස්නයිසර් | 02 |
| 77. | යකඩ තාච්චි | 02 |
| 78. | ඇළුමිනියම් තාච්චි | 01 |
| 79. | මේස හැදි | 04 |
| 80. | මොන්ටර් | 01 |
| 81. | පාපැදි ප්‍රීවිල් | 01 |

01-573

## රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන ඡේදයට අනුව පහත නම සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : බෙස්ට් බිසිනෙස් ලංකා (පීවීටී) එල්ඩීඩී
ලියාපදිංචි අංකය : පීවී 00215011
සංස්ථාගත කළ දිනය : 2019.08.30
ලියාපදිංචි ලිපිනය : අංක 33/50, සින්න තෝනා වීදිය, කාත්තාන්කුඩි 02.

එස්. එච්. එම්. රිස්වි,
සමාගම් ලේකම්.

01-404

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

මහනුවර දිස්ත්‍රික්කයේ, පේරාදෙණිය පාර අංක 156/6 හි පදිංචි පුෂ්පා චාන්දනි තිලකරත්න (ජාතික හැඳුනුම්පත් අංක 555421494 V හිමි) වන මම මහනුවර පේරාදෙණිය පාර අංක 156/6 ලිපිනයේ පදිංචි රධිකා ශිරන්ති තිලකරත්න (ජාතික හැඳුනුම්පත් අංක 567620921 V හිමි) යන අය වෙත ඇටෝර්නි බලය පවරමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සංජය පී. විජේතුංග මහතා විසින් 2008 ක් වූ ජුනි මස 09 වැනි දින ලියා සහතික කළ අංක 668 දරන ඇටෝර්නි බලපත්‍රය එහි ඇටෝනි අධිපති වන මා විසින් වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින වලංගු කරන ලද බවත් මින් ඉදිරියට එකී රධිකා ශිරන්ති තිලකරත්න (ජා. හැ. අංක 567620921 V හිමි) යන අය විසින් එම ඇටෝර්නි බලපත්‍රය උපයෝගි කර ගනිමින් සිදු කරනු ලබන කිසිදු ගනුදෙනුවකට හා එය උපයෝගි කරගෙන කරන කිසිම ක්‍රියාවකට වග නොකියන බවට මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දන්වා සිටිමි. මෙම ඇටෝර්නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍යම කලාප කාර්යාලය, මහනුවර හි ලිඛිතව බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ දින පොත් අංක 1292 යටතේ 03 වන කාණ්ඩයේ 34 වන පත්‍ඉරුවේ ලියාපදිංචි කරන ලදී.

පුෂ්පා චාන්දනි තිලකරත්න,
ඇටෝර්නි අධිපති.

01-405/1

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

මහනුවර දිස්ත්‍රික්කයේ, පේරාදෙණිය පාර අංක 156/6 හි පදිංචි පුෂ්පා චාන්දනී තිලකරත්න (ජාතික හැඳුනුම්පත් අංක 555421494 V හිමි) වන මම මහනුවර ගම්පල හිල් ස්ට්‍රීට් අංක 21 ලිපිනයෙහි පදිංචි ප්‍රභාත් පරාක්‍රම රණවීර (ජා. හැ. ප. අංක 611830017 V) යන අය වෙත ඇටෝර්නි බලය පවරමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සංජය පී. විජේතුංග මහතා විසින් 2003 ක් වූ දෙසැම්බර් මස 13 වැනි දින ලියා සහතික කළ අංක 142 දරන ඇටෝර්නි බලපත්‍රය එහි ඇටෝනි අධිපති වන මා විසින් වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින අවලංගු කරන ලද බවත් මින් ඉදිරියට එකී ප්‍රභාත් පරාක්‍රම රණවීර (ජා. හැ. අංක හිමි 611830017 V හිමි) යන අය විසින් එම ඇටෝර්නි බලපත්‍රය උපයෝගි කර ගනිමින් සිදු කරනු ලබන කිසිදු ගනුදෙනුවකට හා එය උපයෝගි කරගෙන කරන කිසිම ක්‍රියාවකට වග නොකියන බවට මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දන්වා සිටිමි. මෙම ඇටෝර්නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍යම කලාප කාර්යාලය, මහනුවර හි ලිඛිතව බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ දින පොත් අංක 1473 යටතේ 19 වන කාණ්ඩයේ 14 වන පත්‍ඉරුවේ ලියාපදිංචි කරන ලදී.

පුෂ්පා චාන්දනි තිලකරත්න,
ඇටෝර්නි අධිපති.

01-405/2

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව සමාගමේ නාමය වෙනස් වීම පිළිබඳ දැන්වීමයි.

පෙර පැවති නාමය : මධු නදී ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 74960
ලියාපදිංචි ලිපිනය : අංක 231/32, පීටර් මාවත, අමන්දොළුව, සීදුව.
නව නාමය : නිව් මධු නදී ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්.
නාමය වෙනස් කළ දිනය : 2018 ජූලි මස 13 වැනි දින.

සමාගමේ ලේකම්වරු.

01-440

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

නුගේගොඩ හයිලෙවල් පාර, අංක 202 හි පදිංචි ෆාතිමා ෆර්හා ෆයිසාල් විවාහයට පෙර කොහොම්බන් ආරච්චිගේ තනූජා ලක්ෂින් (ජාතික හැඳුනුම්පත් අංක 737170039 V) වන මම ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය සහ එහි පොදු ජනතාව වෙත මෙයින් දන්වා සිටින වගනම් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කීර්ති උඩවත්ත විසින් සහතික කරන ලද වර්ෂ 2003 ජනවාරි 22 වැනි දින අංක 298 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් තෙන්නකෝන් මුදියන්සේලාගේ පත්මලතා (ජාතික හැඳුනුම්පත් අංක 717383630) ඇටෝර්නි බලකරු සේ කරන ලද පත්කිරීම මෙයින් අවලංගු කරන බවත් මින් ඉදිරියට ඇය විසින් සිදු කරන කිසිදු ගනුදෙනුවක් සඳහා මාගේ වගකීමක් නොමැති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ෆාතිමා ෆර්හා ෆයිසාල්.

01-452

**දැන්වීම**

ඩුනාමිස් කැපිටල් පී. එල්. සී. සමාගම

ජනශක්ති පී. එල්. සී. සමාගම සමඟ ඒකාබද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තියට ප්‍රකාරව දන්වා සිටින්නේ, ඩුනාමිස් කැපිටල් පී. එල්. සී. සමාගම සහ ජනශක්ති පී. එල්. සී. සමාගම, සමාගම් පනතේ 239 වන වගන්තියට ප්‍රකාරව ඒකාබද්ධ කර ඇති බවත්, එම ඒකාබද්ධ සමාගම ජනශක්ති පී. එල්. සී. වන බවත් ය.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් මෙම ඒකාබද්ධ කිරීම අනුමත කර ඇති අතර, එම ඒකාබද්ධ කිරීමේ බලාත්මක දිනය වන්නේ 2019 දෙසැම්බර් 06 වන දිනයයි.

ඒකාබද්ධ කිරීමේ සහතිකය සහ සංස්ථාගත කිරීම සහතිකය, ජනශක්ති පී. එල්. සී. හි ලියාපදිංචි කාර්යාලය වන අංක 02, ඩීල් පෙදෙස, කොළඹ 03, යන ස්ථානයේ දී පරීක්ෂා කළ හැක.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගයෙන්,

කේ. එච්. එල්. කෝපරේට් සර්විසස් ලිමිටඩ්,
ජනශක්ති පී. එල්. සී.

01-456

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : චන්ගමී කොරියන් සප්ලයිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 105754
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 251/10, කිරුළ පාර, කොළඹ 05.
ලියාපදිංචි දිනය : 2015.05.21

සමාගමේ නම : ඉන්ට්‍රින්සික් ලීඩර්ෂිප් ඇකඩමි (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 127389
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 97, ගාලු පාර, කොළඹ 03
ලියාපදිංචි දිනය : 2017.11.20

(ඉහත සඳහන් සමාගමේ ලේඛම්වරු)

01-469

---

## දැන්වීමයි

වර්ෂ 2019.11.22 වැනි දින පළ කරන ලද අංක 2151 දරන ගැසට් පත්‍රයේ 11-1592 දරන නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතුය :

සංශෝධනයයි

අංක 57/ඩී, හියාරේ හන්දිය, ගොනාමුල්ල හි පදිංචි ජයසුන්දර ආරච්චිගේ විසුද්ධ නාමල් වන මා 2016.06.12 වැනි දින අත්සන් තබන ලද අංක 1407 දරන ඇටෝර්නි බලපත්‍රය ගාල්ල දකුණු කලාප කාර්යාලයේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටර්නි බලපත්‍ර 69 කාණ්ඩයේ 46 පත්ඉරුවේ 1472 දිනපොතේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස වලහන්දූව, මානවිල, ගමගෙ වත්ත ''තිළිණි'' හි පදිංචි හබරාදූව හේවගේ තිළිණි මධුෂානි සමරසිංහ යන අයගේ පත් කිරීම වර්ෂ 2019 ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින සිට නිත්‍යානුකූලව අවලංගු කරන බව මින් සියලු දෙනාගේ දැන ගැනීම පිණිස නිවේදනය කරනු ලැබේ.

ජයසුන්දර ආරච්චිගේ විසුද්ධ නාමල්.

01-480

---

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : හයිරියා ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : 84/4 එච්, පල්ලේවැලිකැටිය, බුලුගොහොතැන්න, අකුරණ
සංස්ථාගත කළ දිනය : 2017 නොවැම්බර් 27
ලියාපදිංචි අංකය : පී වී 127614.

අධ්‍යක්ෂකවරු.

01-489

---

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සාරුැක් ජෙම් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි කාර්යාලය : 125/1 ඩී, පල්ලේවැලිකැටිය,
බුලුගොහොතැන්න, අකුරණ
සංස්ථාගත කළ දිනය : 2019 නොවැම්බර් 05
ලියාපදිංචි අංකය : පීවී 00217254

අධ්‍යක්ෂකවරු.

01-490

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් පෞද්ගලික සීමිත වගකීම් සහිත සමාගම 2020 දෙසැම්බර් මස 19 වැනි දින සංස්ථාගත කරන ලද බව මින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : එස්. කේ. ෆාර්ම් ඇන්ඩ් ඇග්‍රිකල්චර් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පීවී 00218532
ලියාපදිංචි කාර්යාලය : අංක 14, දෙවන හරස් වීදිය, උදයනගර්,
කිළිනොච්චිය.

සමාගම් ලේකම්.

01-615

---

## කැන්ඩර් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය පීවී 75998

සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දැන්වීම

2019 නොවැම්බර් මස 14 වැනි දින සමාගමේ සම්මත වූ විශේෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) (b) වගන්තිය යටතේ මෙම සමාගම 2019 නොවැම්බර් මස 14 වැනි දින සිට සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

එස්. වී. ද සෝසා,
ආර්. එන්. දේවිදි,
ඩී. ආර්. අබේසූරිය,
අධ්‍යක්ෂකවරු.

2019 නොවැම්බර් මස 26 වැනි දින.

01-617

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සමාගමේ නම පහත පරිදි වෙනස් කර ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නම : ත්‍රී ඩී හෝම්ස් (පී වී ටී) එල්ටීඩී
වෙනස් කළ පසු නාමය : විලාස් කන්ස්ට්‍රක්ෂන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00217505
ලියාපදිංචි කාර්යාලය : අංක 115/6 ඒ, පොකුණ පාර,
මාලාමුල්ල, පානදුර
ලියාපදිංචි දිනය : 2019.12.27

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

01-506

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන ලද්දේ 2018.10.15 වැනි දිනැති ලිවර්පූල්, එක්සත් රාජධානියේ සොලිසිට්ටර් ඩේවිඩ් ස්පීඩ් මහතා විසින් සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය කොළඹ 06, වැල්ලවත්ත, ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන පාර, අංක 69 හි පදිංචි සන්නාසි මුත්තයියා ෂන්මුගරාජා යන අයට C/O T2M SW London Ltd, No. 28, London Road Tooting London SW 17 9HW, United Kingdom හි පදිංචි අල්රින් ගෝබිනාත් ෂන්මුගරාජා වන මා විසින් ලබාදුන් එකී ඇටෝර්නි බලපත්‍රය 2019.10.28 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලදී. මෙදින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවරවලට මා වගකියනු නොලැබේ.

අල්රින් ගෝබිනාත් ෂන්මුගරාජා.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින.

01-492

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වනු ලැබේ.

සමාගමේ නම : විකසිත ගාර්ඩන්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00209219
ලියාපදිංචි කළ දිනය : 2019.02.25
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 15/1/1, බ්‍රැන්ඩියාවත්ත පාර, වැල්ලම්පිටිය, කොලොන්නාව - 10600

සමාගම් ලේකම්.

01-669

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

පුත්තලම දිසා අධිකරණයේ දී ය

පුත්තලම කුරුණෑගල පාරේ, අංක 116 A දරන ස්ථානයේ ''පුත්තලම ශාඛාව'' යනුවෙන් හැඳින්වෙන ශාඛා කාර්යාලයේ සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ කොළඹ 01, ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවතේ, අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

.............................පැමිණිලිකරු

එදිරිව

පුත්තලම, 3 වන හරස් වීදිය, 3 වන පටුමග, අංක 32/1 දරන ස්ථානයේ

අබ්දුල් වහීඩ් අබ්දුල් රාවුෆ්බාන්.

...............................විත්තිකරු.

නඩු අංකය : 74/MB

ස්වභාවය : උකස්

වටිනාකම : රු. 394,677,27

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2018 ක් වූ මාර්තු මස 12 වැනි දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට විත්තිකරුට විරුද්ධව තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

පැමිණිල්ලේ ආයාචනයේ (අ) ඡේදයේ අයැද ඇති පරිදි රු. 303,200 ක මුදලක් සහ රු. 91,477.27 ක මුදලක් යනුවෙන් එකතුව රු. 394,677.27 ක් වන්නාවූ මුදලක් සහ එකී රු. 303,200 ක මුදල මත 2014 නොවැම්බර් මස 06 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 19% බැගින් වැඩිදුරටත් පොළියක් ද ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ සහ මෙහි වූ උපලේඛනයෙහි විස්තර ඇති ඉඩම සහ ස්ථානය බන්ධනය වී ඇති බවට සහ ඇස්කිසි කළ හැකි බවට ද නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2018 ක් වූ මාර්තු මස 12 වැනි දින පුත්තලම දිසා අධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ, එම දේපළ පිහිටි ස්ථානයේදී වර්ෂ 2020 ක් වූ පෙබරවාරි මස 07 වැනි දින ප. ව. 1.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම කඩවත් කොට්ඨාසය ඇතුළත පුත්තලම කඩවත් හි පුත්තලම නගර සභා සීමාව ඇතුළත දකුණු නාගමඩුව හි පිහිටා ඇති ''ඔඩයාවේලිකානි'' යනුවෙන් හැඳින්වෙන බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඉඩම වේ. මෙය පුත්තලමේ බලයලත් මිනින්දෝරු ආර්. කේ. කනගරත්නම් විසින් සාදන ලද අංක 7014 සහ 1997.08.12 වැනි දින දරන සැලැස්මේ අංක 78 දරන බිම් කැබැල්ල ලෙස නිරූපිත අතර ප්‍රමාණයෙන් පර්චස් නවයකින් (අ. 0 රූ. 0 පර්. 9) යුක්තය. එසේ නැතහොත් උතුර සිට දකුණට අඩි (30') තිහයි. නැගෙනහිරට සිට බස්නාහිරට අඩි (75') හැත්තෑපහයි සහ එකී ඉඩමට මායිම් උතුරට : කන්දයියාගේ සහ අනිකුත් අයගේ ඉඩම, නැගෙනහිරට : අංක 7014 දරන සැලැස්මේ අංක 114 බිම් කැබැල්ල ලෙස ලකුණු කර ඇති අඩි (15') පහළොවක ප්‍රවේශ මාර්ගය, දකුණට : අංක 7014 දරන එම සැලැස්මේ අංක 77 බිම් කැබැල්ල සහ බස්නාහිරටඃ අංක 7014 දරන සැලැස්මේ අංක 55 බිම් කැබැල්ල වේ. සමස්ථයම මෙකී සීමාවන් ඇතුළත පිහිටියේ ය. එෆ්. 99/239 හි ලියාපදිංචි කර ඇත.

මැතක දී කරන ලද මැනීමක් අනුව, එකී ඉඩම පුත්තලමේ බලයලත් මිනින්දෝරු වී. ටී. බාලසුබ්‍රමානියම් විසින් සාදන ලද අංක 3936 සහ 2009.05.07 වැනි දින දරන සැලැස්මේ අංක 01 බිම් කැබැල්ල ලෙස නිරූපිතව ඇත. එම බිම් කැබැල්ලට මායිම් උතුරට : කේ. කන්දයියාගේ සහ අනිකුත් අයගේ ඉඩම, නැගෙනහිරටඃ අංක 7014 දරන සැලැස්මේ අංක 114 බිම් කැබැල්ල වන අඩි (15') පහළොවක පළල අඩිපාර, දකුණට : අංක 7014 දරන සැලැස්මේ අංක 77 බිම් කැබැල්ල, බස්නාහිරට : අංක 7014 දරන සැලැස්මේ අංක 55 බිම් කැබැල්ල සහ ප්‍රමාණය පර්චස් නවයක් (අ. 0 රූ. 0 පර්. 9) වේ. සමස්ථයම මෙම සීමාවන් ඇතුළත පිහිටා ඇත.

ඉඩමට පිවිසීම. - පුත්තලම නගරයේ සිට තම්බපන්නි පටුමග (කුවේට් හොස්පිටල් පාර) හංදිය දක්වා කිලෝමීටර් 2.2ක් පමණ දුරක් මන්නාරම පාර ඔස්සේ ගමන් කර ඉහත සඳහන් කළ පාරට දකුණට හැරී මීටර් 700ක් පමණ ගමන් කර වෙන් කරන ලද කොටස්වලට මග පෙන්වන පාර වෙන්කිරීමට වමට හැරී තවදුරටත් මීටර් 100ක් පමණ දුරක් ගමන් කළ විට මාර්ග අවසානයට ඇති දේපළ වෙත ළඟා විය හැක.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාර ගනු නොලැබේ.

(1) ගැණුම්කරුවන් විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%), (2) නොතාරිස් ගාස්තු ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තුව, (3) සියලුම ප්‍රචාරක වියදම්, (4) වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු සියයට දෙකයි දශම පහයි (2.5%), (5) රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු (6) ලිපිකරු සහ සෝෂක ගාස්තුව රු. 6,000, (7) ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහ (75%) මුදල දින 30ක් ඇතුළත දී පුත්තලම දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතු ය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

සමරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810, 2 වන මහල,
මරදාන පාර,
කොළඹ 10.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු.
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්
වාණිජ මහාධිකරණය සහ කොළඹ දිසා
අධිකරණයේ සහ ගාල්ල දිසා අධිකරණයේ
බලයලත් වෙන්දේසිකරු.

රාජ්‍ය හා වාණිජ බැංකු අංක 200,
2 වන මහල, හල්ෆ්ඩ්‍රෝප් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 011- 2445393/011- 2396520.
ඊමේල් : senaservice84@gmail.com

දුරකතන අංක : 011-2672262
011-2672263
ෆැක්ස් 011-2683073.

01-478

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මීගමුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2015.02.16 දින සහතික කළ අංක 4883 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රොනි කොටේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අය විය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් සහ වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී වර්ෂ 2020 ක් වූ පෙබරවාරි මස 10 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ මීගමුව මහ නගර සභා සීමාව තුළ 75 ඒ - පලගතුරය ග්‍රාම නිලධාරි වසම තුළ පලගතුරේ ගමේ පිහිටි කුඹුක්වත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බාලේන්දිරන් විසින් සාදන ලද අංක 2014.01.209 හා 2014.09.13 දින දරන පිඹුරේ ලොට් ''ඒ'' වශයෙන් දක්වෙන ඉඩම් කොටස,

ප්‍රමාණය : රූඩ් එකයි පර්චස් දොළහයි දශම අටයි පහක් (අ. 0, රූ. 1, පර්. 12.85) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.07.26 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ 2019.08.13 වැනි දින මව්බිම, ඩේලිමිරර් සහ තිනකුරල් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම. - දළුවකොටුව හංදියේ සිට හලාවත - කොළඹ ප්‍රධාන පාර ඔස්සේ මීටර් 140ක් පමණ මීගමුව දෙසට ගමන් කර ශාන්ත ආනා පාරට දකුණට හැරී කිලෝමීටර් 1.1ක් පමණ ගමන් කර පලගතුරේ පල්ලිය ඉදිරිපිටින් වමට හැරී මීටර් 100ක් පමණ ගමන් කර වමට ඇති අදාළ දේපළ වෙතට ළඟා විය හැක.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසන් වූ වහාම උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුයි. චෙක්පත් භාර ගනු නොලැබේ.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් (07) ගැණුම් මිලේ ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී හැටන් නැෂනල් බැන්ක් පි. එල්. සී. වෙත ගෙවිය යුතුයි. දින 30ක් තුළ දී ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල ආපසු නොගෙවන අතර, දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12,
දුරකතන/ෆැක්ස් 011- 2445393,
ඊමේල් : senaservice84@gmail.com

ජ්‍යෙෂ්ඨ කළමණාකරු - ණය අයකිරීම්,
හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.,
අංක 479, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.
දුරකතන අංක : 011-2661828/011-2661866.

01-505

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කළුතර ශාඛාව**

1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බී ෆැෂන් ගාමන්ට්ස් යන නාමය අභිධානය හා ව්‍යවහාරික ව්‍යාපාරික නාමය යටතේ තනි හිමිකාරිත්වයක් ලෙස ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන වෙල්අරුමගේ කසුන් බුද්ධික ප්‍රනාන්දු විසින් ණයකරු වශයෙන් පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඩබ්. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට ලියා සහතික කරන ලද අංක 5071 හා 2015 දෙසැම්බර් මස 10 වැනි දින දරන බැදුම්කර හා හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් වෙල්අරුමගේ කසුන් බද්ධික ප්‍රනාන්දු වෙත ප්‍රදානය කරන ලද නිවස ණය පසුකම් ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 5386 හා 2016 සැප්තැම්බර් මස 30 දින දරන සහ කළුතර ප්‍රසිද්ධ නොතාරිස් වයි. එන්. පී. ද සිල්වා විසින් ලියා සහතික කරන ලද අංක 2263 හා 2018 මැයි 10 දින දරන උකස් බැදුම්කර යටතේ මගින් මෙහි උපලේඛනයේ වඩාත් සම්පූර්ණයෙන් විස්තර කර ඇති දේපළ ණයකරු වෙල්අරුමගේ කසුන් බුද්ධික ප්‍රනාන්දු ලෙස පැහැර හැර ඇති හෙයින් බැදුම්කරය යටතේ අය විය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපළ,

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2020 පෙබරවාරි 6 වැනි දින පෙ. ව. 11.30 දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණේ උතුර, කළුතර ප්‍රාදේශීය කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව ඇතුත 729 ඒ අලුබෝගහලන්ද ග්‍රාම නිලධාරි වසම තුළ නාගොඩ පිහිටි අලුබෝගහවත්ත පින්නකොලලන්ද සහ අලුබෝගහවත්ත කොටසක් හෙවත් පින්නකොලලන්ද නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එම්. වී. ටී. පී. ජයසුන්දර විසින් සාදන ලද අංක 11/07 හා 2011 ජනවාරි මස 18 වැනි දින දරන පිඹුරේ දක්වෙන ලොට් ඒ දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම දෙකයි බිංදුවක් වූ (අ. 0, රූ. 0, පර්. 23.20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළුව සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2019.06.28 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද, 2019.07.11 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසෙන මාර්ගය. - කළුතර කටුකුරුන්ද හන්දියේ සිට මතුගම පාර දිගේ කි. මී. 1.25 පමණ දුරක් ගොස් වම් පැත්තට හීනටියගල පාරට හැරෙන්න. තවදුරටත් මීටර් 350ක් පමණ හීනටියගල පාර දිගේ ගොස් සෙන්ටර් හන්දියෙන් දකුණු දෙසට ශ්‍රී සන්දර්ෂනාරාම පාරට (අඩි 12 පළල පාර) හැරී මීටර් 150 පමණ එම පාර දිගේ ගමන කරන්න. "Y" හන්දියන් සහ ක්‍රීඩාපිට්ටනිය හමුවේ. මිනින්දෝරු සැලැස්මේ සඳහන් ඇති "Y" හන්දියට මුහුණ දී අදල දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. -

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතුයි. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකතන අංක : 011 2661866, 011- 2661828

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු (මුළු දිවයිනට ම)

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකතන අංක : 011- 2053286/072-3207533
076-9217329/072-0881044.

01-511

---

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/73/2019/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2020.01.17 වැනි දින සිට 2020.01.31 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2020.02.07 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| --- | --- | --- |
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 662 වෙළුමේ | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, ගොඩිගමුව පිහිටි 'මදුගහවත්ත' නමැති ඉඩමේ අංක 5 දරන කැබැල්ලට බලයලත් මානක වී. ඒ. එල්. සෙනරත්න මහතා විසින් 1958.02.24 වැනි දින මැන සාදන ලද අංක 55 පත්ඉරුව. 1202/1202A දරන පිඹුරට ප්‍රකාර මායිම්,<br><br>උතුරට : වයි. දොන් ඩේවිඩ්ට අයත් ඉඩම,<br>නැගෙනහිරට : ලොට් 06,<br>දකුණට : ලොට් 09,<br>බස්නාහිරට : ලොට් 04.<br><br>බිම් ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 22. | 01. එස්. සෝමනාතන් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1959.10.02 වැනි දින අංක 1116 දරන විකුණුම් ඔප්පුව. |

01 - 464

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/49/2019/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2020.01.17 වැනි දින සිට 2020.01.31 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2020.02.07 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| --- | --- | --- |
| මීගමුව දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ කොට්ඨාසයේ 284 වෙළුමේ 58 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ, දූනගහ පත්තුවේ, අළුත්කුරු කෝරළයේ උතුරු කදිරාන ග්‍රාමයේ 'උළුඅම්බලමවත්ත' නමැති ඉඩමට බලයලත් මානක සී. ආර්. ෆෙල්සිංගර් මහතා විසින් 1931.12.28 වැනි දින මැන සාදන ලද අංක 1481 දරන පිඹුර සඳහා මායිම්,<br><br>උතුරට : එච්. එස්. ගුණසේකරට අයත් මෙම ඉඩමේ කොටස,<br>නැගෙනහිරට : එච්. එස්. ගුණසේකර හා පී. ආර්. ගුණසේකරට අයත් මෙම ඉඩමේ කොටස,<br>දකුණට : පී. ආර්. ගුණසේකරට අයත් මෙම ඉඩමේ කොටස,<br>බස්නාහිරට : ඒ. ආර්. එන්. කේ. චෙට්ටි හා තවත් අයට අයත් මෙම ඉඩමේ කොටස.<br><br>බිම් ප්‍රමාණය : අ. 26, රූ. 03, පර්. 04. | 01. ඊ. ඕ. එෆ්. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1932.02.28 වැනි දින අංක 16 දරන තෑගිකරය.<br><br>02. ආර්. අබේසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1972.01.29 වැනි දින අංක 27 දරන තෑගිකරය. |
| මීගමුව දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ කොට්ඨාසයේ 234 වෙළුමේ 299 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ, දූනගහ පත්තුවේ, අළුත්කුරු කෝරළයේ උතුරු කදිරාන ග්‍රාමයේ 'උළුඅම්බලමවත්ත' නමැති ඉඩමට බලයලත් මානක ඩී. ජී. එම්මානුවෙල් මහතා විසින් 1915.01.23 වැනි දින මැන සාදන ලද අංක 171 දරන පිඹුර සඳහා මායිම්,<br><br>උතුරට : එදිරිමුණි ජේන් ලැටිනා හාමිනේගේ ඉඩම,<br>නැගෙනහිරට : බේස්ලයින් පාර,<br>දකුණට : මෙම ඉඩමේ අනෙක් කොටස්,<br>බස්නාහිරට : හමුද්දර ඈන් ද සිල්වා ගුණසේකරගේ ඉඩම.<br><br>බිම් ප්‍රමාණය : අ. 20, රූ. 0, පර්. 0. | 01. කේ. ඒ. ටී. ප්‍රසිද්ධ රසිංහ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1925.08.04 වැනි දින අංක 2357 දරන විකුණුම්කරය.<br><br>02. ඊ. ඕ. එෆ්. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1932.04.07 වැනි දින අංක 17 දරන විකුණුම්කරය.<br><br>03. ආර්. අබයසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1972.01.29 වැනි දින අංක 28 දරන තෑගිකරය. |

01 - 463

---

**I කොටස : I ඡේදය යටතේ පළවන ඉතිරි සියලු දැන්වීම් 2020.01.17 දින ගැසට් පත්‍රයේ පළවේ.**

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk